## Corona Virus යනු කුමක්ද ?

Corona වෛරසය මිනිසුන්ට මෙන්ම සතුන්ට රෝග ඇති කරන රෝග කාරකයකි. මෙමගින් සුළු සෙම්ප්‍රතිශ්‍යාව මෙන්ම දරුණු SARS නියුමෝනියා රෝගය වැනි තදබල ශ්වසන ආබාධ ද හටගත හැක.

## MERS-CoV ආසාදනය යනු කුමක්ද ?

මිනිසුන් අතර මෙතෙක් දක්නට නොවූ Corona වෛරස් පවුලට අයත් නවතම වෛරස් ප්‍රභේදයක් 2012 වසරේ අප්‍රේල් මස ප්‍රථම වරට හඳුනා ගන්නා ලද අතර එය Middle East Respiratory Syndrome Corona Virus (MERS-CoV) ලෙස නම් කරන ලදී. එයින් හට ගන්නා රෝගය MERS-CoV ආසාදනය ලෙස හඳුනා ගෙන ඇත.

## MERS-CoV ආසාදනය දක්නට ලැබෙන්නේ කිනම් රටවලද ?

2012 සැප්තැම්බර් මස සිට මේ වනතෙක් මරණ 46 ක් ඇතුළුව මෙම රෝගීන් 94 ක් ලෝකයේ රටවල් 9 කින් එනම් ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ජෝර්දානය, කටාර්, සවුදි අරාබියාව, ටියුනීසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා එක්සත් රාජධානිය යන රටවලින් වාර්තා වී ඇත.

මෙම රෝගීන්ගේ දත්ත විශ්ලේෂණය කිරීමේදී මොවුන් සියළු දෙනා හට මැද පෙරදිග සමග ඍජු හෝ වක්‍රව යම් සම්බන්ධතාවක් තිබූ බව පෙනී යයි.

## මෙහි රෝග ලක්ෂණ කවරේද ?

මෙම රෝගය තද උණ, කැස්ස, හතිය හා ශ්වසන අපහසුතා සහිත තීව්‍ර ශ්වසන ආසාදනයක් ඇති කරයි. බොහෝ රෝගී තත්ත්ව නියුමෝනියාව දක්වා වර්ධනය වේ. දැනට වාර්තා වූ රෝගීන් ගෙන් සමහරෙකුට රෝග ලක්ෂණයක් ලෙස පාචනය තිබී ඇති අතර සමහරෙක් හට වකුගඩු අකර්මන්‍යතාවය ද වැළඳී ඇත.

## මෙම රෝගය බෝවන්නේ කෙසේද ?

දැනට ඇති සාක්ෂි අනුව මෙම රෝගය එක් පුද්ගලයෙකු ගෙන් තවත් පුද්ගලයෙකුට බෝවීමේ හැකියාව පෙන්වන නමුත් මේ වන තෙක් ප්‍රජාව තුළ සීඝ්‍රයෙන් පැතිරීමක් නොපෙන්වයි.

දැනට වාර්තා වූ රෝගීන් ගැන සලකා බැලීමේදී රෝහල් කාර්ය මණ්ඩල, වැඩපලවල සේවකයන් සහ පවුලේ සාමාජිකයන් වැනි මිනිස් සමූහ (Cluster) අතර රෝගය පැතිර යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි.

කෙසේ වෙතත් මෙම වෛරසය ශ්වසන ක්‍රියාවලිය තුළින් (කැස්ස හෝ කිවිසුම් යාම) හෝ රෝගීන් හා ආශ්‍රයේදී ඍජු ස්පර්ශය තුළින් හෝ රෝගීන් විසින් භාවිතා කරන ලද භාණ්ඩ හෝ පරිසරය තුළින් බෝ වන්නේ දැයි තවමත් පැහැදිලි නැත.

## රෝගය සඳහා නියමිත ඖෂධයක් හෝ එන්නතක් තිබේද ?

රෝගය සඳහා නිශ්චිත ප්‍රතිකාරයක් මෙතෙක් සොයාගෙන නොමැත. මෙම රෝගීන් හට අදාල රෝග ලක්ෂණ හෝ රෝගී තත්ත්ව මත උපකාරක ප්‍රතිකාර ලබා දිය යුතුය.

**මෙම රෝගයෙන් ආරක්ෂා වන්නේ කෙසේද ?**

පහත උපදෙස් පිළිපැදීමෙන් මෙම රෝගයෙන් බොහෝ විට ආරක්ෂා විය හැකිය

- ශ්වසන ආසාදනයන්ගෙන් පෙළෙන්නන් සමග සමීප ආශ්‍රයෙන් හැකිතාක් දුරට වළකින්න.
- හැකි සෑම විටම සබන් යොදා දෑත් සෝදා ගන්න.
- ඔබ තීව්‍ර ශ්වසන රෝගයකින් පෙළෙන්නේ නම් සෙනග ගැවසෙන ස්ථාන වලට යාමෙන් වළකින්න.
- කිවිසින විට හා කහින විට ලේන්සුවකින්, වැලමිටෙන් හෝ ටිෂූ කඩදාසියකින් මුව ආවරණය කර ගන්න.
- එසේ පාවිච්චි කළ ලේන්සු කිලිටි වූ විට සෝදා ගන්න සහ ටිෂූ කඩදාසි ආරක්ෂිත ලෙස බැහැර කරන්න.

**අනෙකුත් සාමාන්‍ය උපදෙස් ලෙස (විශේෂයෙන් මැද පෙරදිග සංචාරය කිරීමේදී)**

- හැකි සෑම විටම හොඳින් පිසින ලද කෑම ආහාරයට ගන්න.
- අමු එළවළු හෝ පලතුරු අනුභව කරන්නේ නම් හොඳින් සෝදා හෝ ලෙලි ගසා ආහාරයට ගන්න.
- පිරිසිදු වතුරෙන් සාදාගත් පාන වර්ග පමණක් භාවිතයට ගන්න.
- අනවශ්‍ය ලෙස ගෘහස්ත, ගොවිපල හා වන සතුන් ස්පර්ශ කිරීමෙන් වළකින්න.

**මේ සඳහා ශ්‍රී ලංකාව සූදානම් ද ?**

සියළුම රෝහල් වෙත රෝගය පිළිබඳ ආවේක්ෂණය හා ප්‍රතිකාර ක්‍රමවේදයන් පිළිබඳ උපදෙස් මේ වන විටත් ලබා දී ඇත.

ඒ සමගම මැද පෙරදිග සංචාරයේ යෙදෙන්නන් වෙනුවෙන් සකස් කරන ලද විශේෂ උපදෙස් පත්‍රිකාවක් ආගමික ස්ථාන හා විදේශ රැකියා ඒජන්සි මාර්ගයෙන් බෙදා දීමට කටයුතු කර ඇත.